# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1509/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 25/09/2024 පැය 1235

## මාධ්‍ය නිවේදනය

### පොලිස් නිලධාරියෙකුට අල්ලස් ලබාදීම සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මාතලේ පොලිස් ස්ථානය.

2024.09.24 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයාට රුපියල් 5000/= ක අල්ලස් මුදලක් ලබා දීමට තැත් කල පුද්ගලයෙකු මාතලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මාතලේ පොලිස් ස්ථානය වෙත පැමිණි පුද්ගලයකු තමන් පුද්ගලික බැංකුවක වාහන අත්පත් කරගැනීමේ නියෝජිතයෙකු බව සඳහන් කරමින් ලොරි රථයක් අත්පත් කරගැනිම සඳහා නමක් හෝ නිල මුද්‍රාවක් නොමැති බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කර පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් සිදුකිරීමට අවශ්‍ය බව පවසා ඇත.

එහිදි විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් වගකිව යුතු නිලධාරියෙකුගේ නම සහිත නිලමුද්‍රාව තබා ලිපියක් රැගෙන ඒමට උපදෙස් ලබා දී ඇති අතර, එම පුද්ගලයා විසින් එසේ කටයුතු නොකර පොලිස් පරීක්ෂකවරයාට රුපියල් 5000 ක මුදල් ලබා දීමට උත්සහ ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන මාපාකන්ද උතුර, නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**